**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 300 මට්ටම - 2021**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் – 2021**
**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level –2021**

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර – නව නිර්දේශය-පරීක්ෂණය 300 මට්ටම – පෙබරවාරි 2022
**கலைத்தேர்வுப் பரீட்சை) வெளிவாரி-புதிய பாடத்திட்டம் (300 வது தேர்ச்சி மட்டம் – பெப்ரவரி 2022**
**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level – February - 2022**

## SUPE 310: Project Formulation and Evaluation

කාලය පැය (03) තුනයි.
**(மூன்று) 03) மணித்தியாலங்கள்**
Time: three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
**எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.**
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න **05** කට පිළිතුරු සපයන්න.
**05 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.**
Answer **05** questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි
**இந்த வினாப்பத்திரத்தில் 06 னாக்கள் உள்ளன.**
There are 06 questions in the question paper.

---

1 a) ජාතික මට්ටමේ ආයෝජන ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති සංකල්පය ගොඩනගා ගැනීමේ වැදගත්කම ව්‍යාපෘති සංකල්පය/අදහස පිළිබඳ පවතින විවිධ මූලාශ්‍රයන් වෙත අවධානය යොමු කරමින් විස්තර කරන්න. (07 Marks)

b) "වර්තමාන ශ්‍රී ලංකා රජය තෝරාගත් සමහර ආනයන සීමා කරමින් දේශීය කෘෂිකර්මාන්තය හා කර්මාන්ත හා සම්බන්ධ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම මගින් ස්වයංපෝෂිත හා අපනයන ප්‍රවර්ධන නිෂ්පාදන ආර්ථික ක්‍රමයක් වෙත ගමන් කිරීමට උත්සහ කරමින් සිටියි". ඔබ රජයේ ව්‍යාපෘති සැලසුම්කරුවෙකු නම්, ව්‍යාපෘති හඳුනා ගැනීමේ විවිධ ක්‍රම සැලකිල්ලට ගනිමින් මේ සඳහා සුදුසු ව්‍යාපෘතියක් හඳුනාගෙන සැලසුම් කරන්නේ කෙසේද? ඔබ හඳුනාගත් ව්‍යාපෘතියේ ප්‍රමුඛත්වය දිය යුතු අංශ වන්නේ මොනවාද? කෝවිඩ්-19 වසංගත තත්වය නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ පැනනැගී ඇති ප්‍රාග්ධන සම්පාදනයේ හිගය සැලකිල්ලට ගනිමින් ඔබගේ පිළිතුර විස්තර කරන්න. (13 Marks)

2. පේරාදෙණිය නගරය ආශ්‍රිත මහවැලි ගග දෙපස ජල දූෂණය ඉතා බරපතල සමාජාර්ථික හා පාරිසරික ගැටළු ලෙස මධ්‍යම පළාත් සභාව හඳුනාගෙන තිබේ. මෙම ජල දූෂණය පිළිබඳ ගැටලුව විසඳීම සඳහා මධ්‍යම පළාත් සභාව විසින් ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට තීරණය කොට තිබේ. මෙම ව්‍යාපෘති සැලැස්ම පිළියෙළ කිරීම ඔබට පවරා ඇතැයි සිතන්න. ඒ අනුව පහත දැක්වෙන කරුණු ඉලක්ක කර ඒ සඳහා ව්‍යාපෘතියක් ගොඩනගන්න.

a) ඉහත ගැටලුව සඳහා ගැටලු ගස හා අරමුණු ගස ඒවාහී අංග/සංරචක සහ එම අංග/සංරචක අතර අන්තර් සම්බන්ධතා පැහැදිළිව දක්වමින් ව්‍යුත්පන්න කරන්න. (10 Marks)

b) ඉහත ගැටලු විසඳීම සඳහා අවම වශයෙන් සුදුසු විකල්ප උපායමාර්ග තුනක් දක්වන්න. එක් එක් උපායමාර්ගයන් කෙටියෙන් විස්තර කරන්න. (06 Marks)

c) ඉහත ව්‍යාපෘතියේ විවිධ පාර්ශවකරුවන් වර්ග හඳුනාගෙන මෙම ව්‍යාපෘතිය තුළ ඔවුන්ගේ කාර්යභාරය, බලපෑම හා මැදිහත්වීමට ඇති ධාරිතාව පෙන්වාදෙමින් පාර්ශවකරුවන් පිළිබඳ විශ්ලේෂණ සටහනක් (ලේඛනයක්) පිළියෙල කරන්න. (04 Marks)

3. a) තර්කරාමු විශ්ලේෂණ ක්‍රියාවලියක අඩංගු සියලුම පියවරයන් ලැයිස්තුගත කොට එහි ඇතුළත් අංග (උප විශ්ලේෂණයන්) සවිස්තරාත්මකව පහදන්න. (08 Marks)

b) සුදුසු උදාහරණයක් පාදක කොට ගනිමින් තර්කරාමු විශ්ලේෂණ ක්‍රියාවලියක අඩංගු අංග (සංවර්ධන අරමුණ, ව්‍යාපෘති අරමුණ, නිමවුම්, ක්‍රිකාරකම්, යෙදවුම්, සතෝක්ෂණ දර්ශක, තොරතුරු මූලාශ්‍ර හා අදාළ අවධානම් හා උපකල්පන) සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව විස්තරාත්මක තර්ක රාමු න්‍යායයක් සැලසුම් කරන්න. (12 Marks)

4. a) ආයෝජන ව්‍යාපෘතියක සියලුම අනාගත ප්‍රතිලාභ හා පිරිවැය වට්ටම් කිරීමේ අවශ්‍යතාව පැහැදිළි කරන්න. (04 Marks)

b) “ශුද්ධ වර්තමාන වටිනාකම (NPV) ආයෝජනයක ප්‍රතිලාභවල තරම දක්වන දර්ශකයකි. මේ අතර අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතිකය (IRR) ආයෝජනයක කාර්යක්ෂතාව, හා ගුනාත්මකභාවය හෝ ප්‍රතිලාභය දක්වන දර්ශකයකි”. NPV හා IRR හී ශක්තිමත්භාවයන් හා දුර්වලතා පෙන්වා දෙමින් මෙම වගන්තිය විස්තර කරන්න. (08 Marks)

c) ශුද්ධ වර්තමාන වටිනාකම (NPV) හා වට්ටම් අනුපාතිකය අතර සම්බන්ධතාව ප්‍රස්තාරිකව පැහැදිළි කරන්න. ඔබගේ ප්‍රස්තාරය තුළ අවධි අගය/අවධි ලක්ෂය පැහැදිළිව දවමින් පෞද්ගලික ව්‍යවසායයෙකුට ව්‍යාපාරයක් සැලසුම් කිරීමේ අවධි ලක්ෂයේ වැදගත්කම විස්තර කරන්න. (08 Marks)

5 a) “විස්තාරාත්මක වාසි පිරිවැය විශ්ලේෂණයක සමාජ බලපෑම් තක්සේරුවක් (SIA) හා පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) ඇතුළත් කිරිම නව ව්‍යාපෘතියක් ඇගයීමේදී (Comprehensive CB Analysis?) අනිවාර්‍ය අවශ්‍යතාවකි”. ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලනික හා සමාජ- ආර්ථික පසුබිම සැලකිල්ලට ගනිමින් ඔබේ පිළිතුර පැහැදිළි කරන්න. (10 Marks)

b) “ව්‍යාපෘති ඇගයීමේ ක්‍රියාවලිය තුළ විකල්ප ඇගයීමේ ක්‍රියාපටිපාටියක් ලෙස වෙළෙඳ පල අලෙවි නොවන භාන්ඩ හා සේවාවන් ප්‍රමානාත්මකව මැනීම හෝ සැගවුනු මිළ (shadow price) ගනනය කිරීමේ ශිල්ප ක්‍රම දැක්විය හැකිය”. මෙම ප්‍රකාශනය හා ඔබ එකග වන්නේද? ඔබේ පිළිතුර සධාරනීකරණය සඳහා ශ්‍රී ලංකාවෙන් සුදුසු උදාහරණ ඉදිරිපත් කරන්න. (10 Marks)

6. a) වැඩ නිමකරන ලද ව්‍යාපෘතියක් ඇගයීම සඳහා ඔබට පැවරි ඇතයි සිතන්න. එම ව්‍යාපෘතිය සැලකිල්ලට ගෙන බලපෑම් විශ්ලේෂනයක ඇතුළත් විශ්ලේෂනාත්මක වර්ගීකරණයන් විස්තර කරන්න. (12 Marks)

b) කාන්තා සවිබල ගැන්වීමේ සුක්ෂම මූල්‍ය ව්‍යාපෘතියක බලපෑම් විශ්ලේෂණයක් කිරීම ඔබට පැවරී ඇතැයි සිතන්න. කාන්තා සවිබල ගැන්වීම ඇගයීම සඳහා සුදුසු වේයැයි හැගෙන නිර්ණායක විස්තර කරන්න. (8 Marks)